... විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර උපාධි පරීක්ෂණය

පළමු සෙමෙස්තරය - 2018/2019

# ENH 212.3 - සිංහල භාෂා අධ්‍යයනය සඳහා පාලි භාෂා අවබෝධය

(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

01. (අ). පහත සඳහන් ඡේදයට සිංහලට නගන්න.

'සිරිලංකා පන රමණීයො ච සුන්දරො ච එකො දීපො. තත්ථ පාකාරං විය පරික්ඛිපිත්වා පරිසමන්තතො මහාසමුද්දො භවති. අතීතෙ ඉමං දීපං 'ලංකාදීපං' 'ධම්මදීපං' 'සීහළදීපං' 'තම්බපණ්ණිං' 'ධඤ්ඤාගාරං' ඉති සඤ්ඤීයතෙ. සිරිලංකායං සීහළා ච දමිළා ච යොනකා ච නිවසන්ති. එත්ථ ජනෙසු සම්බහුලා සොගතා හොන්ති. ලංකායං මජ්ඣිමපදෙසෙ රමණීයානි ගිරිසිඛරානි ච නානාවිධානි රුක්ඛානි ච සන්ති. 'මහාවාලුකා', 'කල්‍යාණී', 'කාළ', 'වළව' ඉති චත්තාරො මහාගංගායො තම්හා උට්ඨහිත්වා සන්දන්ති. අත්‍ර නගරෙසු අනුරාධපුරනගරං පුරාණතමො. තත්ථ මහාචෙතියානි ච පොරාණවිහාරා ච සෙලමයො පටිමායො ච හොන්ති. සිරිලංකායං උත්තරපදෙසෙ තාලරුක්ඛා ච දක්ඛිණපදෙසෙ නාළිකෙරරුක්ඛා ච බාහුල්‍යෙන පරොහන්ති.

(ලකුණු = 20)

(ආ). පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. අහං පඤ්චසීලං සමාදියාමි.
ii. දෙවො බුද්ධස්ස ධම්මං සුණාති.
iii. උපාසිකා යාචකස්ස භත්තං දෙති.
iv. මග්ගඤ්ඤූ පදිකස්ස මග්ගං දස්සෙති.
v. හෙ නර, ත්වං ඔදනං පචසි.

(ලකුණු 2 X 5 = 10)

02. (අ). හිස්තැනට සුදුසු ක්‍රියා රූපය වරහනෙන් තෝරා ලියන්න.

i. මයං උපාසකස්ස දානං ………………… (දෙති)

ii. අහං පායං ……………….. (පචති)

iii. වනිතායො පුප්ඵානි ………………… (පූජෙති)

iv. ත්වං ඔදනං ……………….. (භුඤ්ජති)

v. මයං හීයො නගරම්හා ……………….. (ආගච්ඡති)

vi. දෙවො ච සකුණො ච ආකාසෙන ……………(ගච්ඡති)

vii. තුම්හෙ ඵලකෙ අක්ඛරානි …………………(ලිඛති)

viii. කම්මකාරො කම්මං ………………… (කරොති)

ix. සබ්බඤ්ඤුනො ධම්මං ………………… (දෙසෙති)

x. රාජා ධම්මිකො ………………… (භවති)

**(ලකුණු 1 X 10 = 10)**

(ආ). කෙටි පිළිතුරු සපයන්න.

i. ඉදිරිපසින් ස්වරයක් එකතු වන අක්ෂරය කුමක් ද?

ii. සිංහල හෝඩියේ ඇති පාලියේ දක්නට නොමැති අකුරු ලියා දක්වන්න.

iii. දත්වලින් උපදින අකුරු ලියා දක්වන්න.

**(ලකුණු 1 + 2 + 2 = 5)**

03. (අ). පහත සඳහන් වාක්‍ය පාලියට නඟන්න.

i. අපි අකුරු ලියමු.

ii. වඳුරෝ ගසෙන් වැටෙති.

iii. ළමයා අතින් බත් කයි.

iv. මම ගුරුවරයෙක් වන්නට කැමැති වෙමි.

v. මට බාලයන්ගේ ඇසුරක් නොවේවා.

**(ලකුණු 2 X 5 = 10)**

(ආ). පහත දැක්වෙන පද අතුරෙන් නිවැරැදි පදය තෝරා ගෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.

(සූරියං, සූරියස්ස, සූරියෙ, සූරියෙන, සූරියො)

i. ..................... ආකාසෙ උදෙති
ii. ..................... පතිබිම්බං ගොලාකාරං භවති
iii. ..................... උග්ගන්තෙසු පදුමානි විකසන්ති.
iv. එකෙ මනුස්සා .................වන්දන්ති
v. තාරගණා .............. සද්ධිං න උදෙන්ති.

**(ලකුණු = 5)**

04. (අ). පහත සඳහන් වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය පමණක් බහුවචනයට හරවා ලියන්න.

i. මනුස්සො පාදෙන මග්ගෙ ධාවි.
ii. ත්වං සහායකෙන සද්ධිං ඵලකෙ නිසීදසි.
iii. අහං ධම්මං සොතුං විහාරං අගච්ඡිං.
iv. කඤ්ඤා පතිදිනං ඔදනං පචති.
v. කච්ඡපො ච මච්ඡො ච උදකෙ ජීවන්ති

**(ලකුණු 2 X 5 = 10)**

(ආ). පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | දුතියා විභක්ති | | චතුත්ථී විභක්ති | | සත්තමී විභක්ති | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| දෙව | ................ | ................ | දෙවස්ස | ................ | ................ | ................ |
| ලංකා | ලංකං | ................ | ................ | ................ | ................ | ................ |

**(ලකුණු = 5)**

පා. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බුභුක්ඛාභිභූතත්තා කොපාවිට්ඨො සීහො 'කස්මා ත්වං චිරායිත්වා ආගච්ඡසී'ති පුච්ඡි. 'සාමි, න මය්හං දොසො. අන්තරාමග්ගෙ අඤ්ඤෙන සීහෙනාහං නිවත්තාපිතොම්හි. යාවාහං භවන්තස්ස සන්තිකමාගන්ත්වා පච්චාගමනාය පටිඤ්ඤං නාදාසිං. තාව මෙ ආගන්තුං නාදාසී'ති සසකො ආහ. තෙනා'තීව කොපාවිට්ඨො සීහො 'සීඝං මෙ තං සප්පගබ්භං සීහං දස්සෙහී'ති වදන්තො තෙන සද්ධිං ගන්තුං නික්ඛමි. අථ සසො තමෙකස්ස ගම්භීරකූපස්ස උපන්තිකං නෙත්වා 'පස්ස, සාමි, සො දුට්ඨො ඉමස්මිං කූපබ්භන්තරෙ වසතී'ති වදන්තො කූපම්බුනි දිස්සමානං තස්සෙව පටිබිම්බං දස්සෙසි. දප්පිතො සීහො මහානාදං නදිත්වා කූපං පක්ඛන්දිත්වා තත්ථෙව මරි.

i. 'කූපබ්භන්තරෙ' යන පදයෙහි තේරුම ලියන්න.
ii. ඉහත ඡේදයෙන් සන්ධි පද හතරක් උපුටා දක්වන්න.
iii. ''ස්වාමීනි මා අත වරදක් නැත'' මේ අදහස ඇති පාලි වැකිය ඡේදයෙන් උපුටා දක්වන්න.
iv. 'අම්බ' සහ 'සීහ' යන පද කෙටියෙන් විවරණය සාරන්න.
v. මෙම කථා පුවතෙන් ලබාදෙන ආදර්ශය කෙටියෙන් පහදන්න.

**(ලකුණු 1+ 2 + 3 + 4 + 5 = 15)**

********************